# ශ්‍රී ලංකාවේ ඡන්දදායක හැසිරීමේ තීව්‍රතාව තීරණය කිරීම සඳහා කුල සාධකයේ බලපෑම

ඩබ්. එම්. සරසි ඡායා බණ්ඩාර
sarasichaya1@gmail.com

දේශපාලනික සීමාවෙන් ඔබ්බට ගිය සමාජයේ විවිධ මට්ටම්වල තීරණ ගැනීමේ ක්‍රියාවලිය හා බැඳුණු පුළුල් අර්ථකථනයක් ඉස්මතු කරන සංකල්පයක් ලෙස දේශපාලන සහභාගීත්වය හඳුනා ගත හැකිය. චර්යාවාදය (Behaviouralism), දේශපාලන සමාජානුයෝජනය (Political Socialization) වැනි මාතෘකාවලට අනන්‍ය වූ මාතෘකාවක් ලෙස දේශපාලන සහභාගීත්වය සලකනු ලබයි. දේශපාලන සහභාගීත්වය වූ කලි මහජනතාව මූලික වන්නකි. මිනිසා විවිධ ස්වරූපවලින් දේශපාලන සහභාගීත්වය පෙන්නුම් කරයි. ඡන්දය ප්‍රකාශ කිරීම පමණකුදු නොව විධිමත්, අවිධිමත් ආකාරවලින් දේශපාලන සහභාගීත්වය සිදු වේ. ශ්‍රී ලංකාව වැනි සංකීර්ණ සමාජ පසුබිමක් සහිත රටක පුද්ගල දේශපාලන සහභාගීත්වයට බලපානු ලබන සාධක රැසකි. එකී සාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ එකිනෙක සමාජයන් හි පුද්ගල දේශපාලන සහභාගීත්වයෙහි ස්වරූපය, තීව්‍රතාව මෙන් ම ප්‍රමාණය ද වෙනස් වේ. සෑම පුරවැසියෙක් ම කුමන හෝ ආකාරයෙන් දේශපාලනයට සහභාගී වේ. ඡන්දදායක චර්යාව එවැනි එක් ආකාරයක දේශපාලන සහභාගීත්වයකි. එනම් මැතිවරණවලදී සිය ඡන්දය භාවිතා කරමින් කරනු ලබන දේශපාලන සහභාගීත්වයයි. ශ්‍රී ලංකාව වැනි පුළුල්, සංකීර්ණ සමාජ පසුබිමක් සහිත සමාජයක ඡන්දදායක චර්යාවේ ස්වරූපය සහ තීව්‍රතාව තීරණය කිරීම කෙරෙහි කුල සාධකය බලපාන්නේද? නැද්ද? යන්න මෙහි අධ්‍යයන ගැටලුවයි. මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිත කළ අතර ප්‍රශ්නාවලි ක්‍රමය මගින් ප්‍රාථමික දත්ත රැස්කර ගන්නා ලදී. මෙම පර්යේෂණයේ ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යාන විධික්‍රම ඔස්සේ ද ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේද ඔස්සේ ද විශ්ලේෂණය කරන ලදී. මෙම පර්යේෂණය තුළින් පැහැදිලි වන්නේ ඡන්දදායක චර්යාව කෙරෙහි කුලය නමැති සංස්කෘතික සාධකය සාධනීය බලපෑමක් සිදු කර ඇති බවයි. තාරුණ්‍යයේ සිට ක්‍රමයෙන් ජ්‍යෙෂ්ඨ පුද්ගලයන් බවට පත්වීමේ දී කුලය සාධකය මත වඩාත් නැඹුරුවක් දක්වා ඇති බවත් වර්තමාන සමාජය තුළ පුද්ගලයාගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාමත් සමග නූතන පරම්පරාව කුලය යන සාධකය පිළිබඳ වැඩි නැඹුරුවක් නොදක්වන බව පැහැදිලිය.

**මුඛ්‍ය පදඃ** ඡන්දදායක හැසිරීම; කුල සාධකය; දේශපාලන සහභාගීත්වය; නූතන පරම්පරාව